## සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය - 2016

-------------------------------------------------------

සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ කර්මාන්තායතනයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.

එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 අහිතකර මතය සඳහා පදනම

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් බොහෝමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 අභිතකර මතය

-----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

-------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය මගින් නියම කරන පරිදි පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය හා සීමා කිරීම් පහත දක්වා ඇති පරිදි වේ.

(ආ) අභිතකර මතය සඳහා දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් සහ විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු හා පැහැදිලි කිරීම් ප්‍රමාණවත් ලෙස නොලැබුණු අතර කර්මාන්තායතනය විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා නොතිබුණි.

(ඇ) කර්මාන්තායතනයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවයන් හා අනුකූල වේ.

(ඈ) සමාගම් පනතේ 220 වගන්තියේ නියම කර ඇති විධිවිධානයන් අනුව කටයුතු කර නොතිබුණි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02**

--------------------------------

තොග වටිනාකම තුළ 2010 වසරටත් පෙර සිට පැවත එන රු. 17,410 ක් වටිනා ගොවිපල ආහාර තොගයක් ඇතුළත්ව තිබුණු අතර මෙම තොගය පොත්වලින් ලියා හැරීමට ප්‍රවර්ථන වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

-----------------------------------

(i) මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබු රු. 47,843,636 ක ස්ථාවර වත්කම් ඒවා මිලට ගත් හෝ භාවිතයට ගත් දිනයන් නොසලකා සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති වත්කම් වටිනාකම මත ක්ෂය ගලපා තිබුණි.

(ii) 2009 දෙසැම්බර් 31 දිනටත් පෙර සිට ජංගම නොවන වත්කම් යටතේ පැවත එන කෙරීගෙන යන වැඩ වටිනාකම රු. 840,774 ක ශේෂයට අදාල ගැලපීම් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් සිදුකර තිබුණි.

(iii) සමාගම විසින් 2015 දෙසැම්බර් 31 දක්වා ඉඩම් සඳහා ක්ෂය කර තිබූ රු. 2,654,357 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ දී ද මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

ආයතනයේ වියදම් ආවරණය කරගැනීම සඳහා 1993 වර්ෂයේ සිට විවිධ අවස්ථාවලදී මහාභාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු. 554,790,332 ක ප්‍රමාණයක් ජංගම වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

පහත සඳහන් විෂයයන්වලට අදාලව ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම නිසා, ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ | 51,183,525 | ශේෂ සනාථන ලිපි |
| ලැබිය යුතු සහ කලින් ගෙවීම් ශේෂ | 40,832,835 | ශේෂ සනාථන ලිපි |
| සේවක වැටුප් | 955,314 | අප්‍රේල් මාසයේ වැටුප් ලේඛනය |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1993 වර්ෂයේ සිට ආයතනය වෙත බාහිර පුද්ගලයෙකුගෙන් අයවිය යුතු රු. 14,036,357 ක ශේෂයක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් පැවතුණි.

(ආ) 2012 සැප්තැම්බර් 09 දින සිට 2014 අප්‍රේල් 30 දක්වා වූ දින 607 ක් සඳහා සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමට උක් බඳින දම්වැල් 700 ක් කුලියට ලබා දීමෙන් අයකර ගත යුතු වූ රු. 4,249,000ක කුලී මුදල සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අයකර ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ඇ) ආයතනය විසින් 1988 වර්ෂයේ සිට 2010 මැයි මාසය දක්වා කාලයට අදාලව ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු රු. 76,352,246 ක ශේෂය 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් නොකර උපචිත වියදම් යටතේ පෙන්වා තිබුණි.

(ඇ) 1993 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුණ තොග හා ණයගැති ශේෂයන් යටතේ ලෙජර් ගිණුම් 12 කට අදාළව රු. 1,924,611 ක බැර ශේෂයන් ද ණයහිමි ශේෂයන් යටතේ ලෙජර් ගිණුම් 03 කට අදාළව රු. 45,397 ක හර ශේෂයන් ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට වලට අනුකූල නොවීම්**

**-----------------------------------------------------------------------------------------**

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවුනු අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (අ) මුදල් රෙගුලාසි 156 (5) හා (6) ඡේද | ගිණුම්වල හෝ ඒ හා සම්බන්ධ මොනයම් ලියවිල්ලක හෝ මකා දැමීම් දිස් නොවිය යුතු අතර ගිණුම් පිළිබඳව සියලුම ලිපි ලේඛන, පොත් පත්, වාර්තා සටහන්, ලේඛණ යනාදිය විධිමත් පරිදි බැහැර කරන තෙක් සුරක්ෂිතව තබා ගත යුතුය. එසේ වුවද ආයතනයේ මුදල් පොත හා අනෙකුත් ලෙජර් ගිණුම් එසේ පවත්වා නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 757 (අ) ඡේදය | බඩු ලේඛන පොත හා ස්ථාවර වත්කම් ලේඛනය තුලනය කර නොතිබුණු අතර තොග හා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**-----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුල ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 2,678,186 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.151,583 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,829,769 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම පෙර වර්ෂයට සාපේක්ෂව රු. 1,262,414 කින් වැඩිවීම හා භාණ්ඩාගාර ප්‍රදාන රු. 1,082,963 කින් අඩු වීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**----------------------------------**

කර්මාන්තයාතනය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාලව ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ SLI Developers (pvt) ltd සහ MG Sugar Lanka (pvt) Ltd ආයතන අතර කොටස්කාර ගිවිසුමක් 2016 අගෝස්තු 11 දින අත්සන් කර ඇති අතර ඊට අදාලව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිවිසුම ප්‍රකාරව ඉඩම් ආයෝජකයාට පැවරීමට අදාල කටයුතු ඉඩම් අමාත්‍යාංශය වෙත පවරා තිබුණද එම කාර්යය 2018 ජනවාරි දක්වා ඉටු වී නොතිබුණි. එමෙන්ම කර්මාන්තායතනය සතු නිළ නිවාස 96 ක අනවසර පදිංචිකරුවන් සිටින බව හඳුනාගත හැකි විය.

(ආ) 2017 ජනවාරි 30 වන දිනැති අංක එච්එෆ්/පීර්/සිඑම්/2017/10 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මගින් කන්තලේ සීනි කර්මාන්තායතනයේ ප්‍රතිව්‍යුහගතකරණයට අදාල කටයුතු කඩිනම් කර මෙහෙයුම් කටයුතු මාස 3 ක් ඇතුළත ආරම්භ කිරීමට ඉඩම් අමාත්‍යාංශය ආයෝජකයා සමග එක්ව කටයුතු කරන ලෙස මුදල් අමාත්‍යවරයා අවධාරණය කර තිබුණද 2018 ජනවාරි දක්වාම මෙහෙයුම් කටයුතු ආරම්භ කොට නොතිබුණි.

(ඇ) අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක පීඑම්ඕ/01/ඒඑස්ආර්(සිසිර්එම්)2017/01 දරන 2017 මාර්තු 17 දිනැති ලිපිය මගින් වත්කම් විකිණීම සඳහා අනුමැතිය ලබා දී තිබු අතර එම කාර්යය මාස 6 ක් තුළ අවසන් කිරීමට උපදෙස් ලබා දී තිබුණි. එහෙත් 2018 ජනවාරි දක්වාම වත්කම් අපහරණ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි.

(ඇ) කර්මාන්තායතනය නව ආයෝජකයාට කඩිනමින් භාරදෙන තෙක් ආයතනයේ කටයුතු සඳහා සාමාන්‍යාධිකාරීවරයා ඇතුළු අත්‍යාවශ්‍ය සේවකයින් දෙදෙනෙකු හෝ තුන්දෙනකු පමණක් රඳවා ගනිමින් ඉතිරි සේවකයන්ගේ කොන්ත්‍රාත් කාලය වහාම අවසන් කිරීමට මුදල් අමාත්‍යවරයා නියම කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. 2018 ජනවාරි වනවිටද අනුයුක්ත සේවකයන් සංඛ්‍යාව 37 ක් විය.

**4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

----------------------------

වාර්ෂිකව සීනි මෙට්‍රික් ටොන් 16,320 ක්, මොලැෂස් මෙට්‍රික් ටොන් 9,000 ක් හා පරිපාරක ස්ප්‍රීතු ලීටර් මිලියන 3.9 ක නිෂ්පාදන ධාරිතාවයකින් යුතු සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය 1993 සැප්තැම්බර් 01 දින සිට තාවකාලිකව රජයට පවරා ගෙන තිබු අතර 1994 මාර්තු 31 දිනෙන් පසුව කිසිදු නිෂ්පාදන කටයුත්තක් සිදුව නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

කර්මාන්තායතනය සතු රු. 25,493,500 ක් වටිනා සැහැල්ලු හා බර වාහන 213 ක් දැනට අවුරුදු 23 කට ආසන්න කාලයක් තිස්සේ පාවිච්චියට නොගෙන කර්මාන්තායතනය තුළ දිරාපත් වෙමින්ද පැවතුණි.

**4.4 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් ආයතනයේ සම්පත්**

------------------------------------------------------------------

කර්මාන්තායතනය සතු වාහනයක්, සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ඉඩම් රාජ්‍ය අමත්‍යාංශයට ලබාදී තිබු අතර මෙම වාහනයේ අළුත්වැඩියා වියදම් ලෙස කර්මාන්තායතනය විසින් සමාලෝචිත වර්ෂයේ රු. 380,300 ක වියදමක් දරා තිබිණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

-------------------------------

කර්මාන්ත ශාලාවේ වත්කම්වල ආරක්ෂාව වෙනුවෙන් සේවකයින් 33 දෙනෙකු හා කාර්යාල නිලධාරීන් 4 දෙනෙකු ලෙස 37 දෙනෙකු සේවයේ යෙදී සිටින නමුත්, අනුමත කාර්ය මණ්ඩලයක් නොවී ය. වර්තමානය වන විට සභාපතිවරයෙකු හෝ අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොමැති මෙම ආයතනයේ කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ සාමාන්‍යාධිකාරීවරයකු විසින් සිදු කර තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත ඉදිරිපත් කළයුතු වුවත් ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුනේ 2017 ජූනි 20 වන දිනදී ය.

## 6. පද්ධති හා පාලනයන්

--------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සාමාන්‍යාධිකාරවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | පිළිගත් ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබීම. |
| (ආ) | තොග පාලනය | තොග සමීක්ෂණයක් සිදුකර යල්පැන ගිය තොග ඉවත් කිරීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | භෞතික සත්‍යාපනයක් කර අපහරණය කළ යුතු වත්කම් හදුනාගෙන ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු නොකිරීම. |
| (ඈ) | මානව සම්පත් පාලනය | මානව සම්පත ප්‍රශස්ත හා ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබීම. |